# හානිපූරණය සඳහා වූ කාර්යාල පනත සාරාංශය

## පනතේ අරමුණ

**මූලික අරමුණ - සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සුබසිද්ධිය සහ යහපත වෙනුවෙන් සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට දායකවන ඵලදායී පිළියමක් ලෙස හානිපූරණය සඳහා වන කාර්යාල පනත ඉදිරිපත් කර තිබේ.**

1. **පනතේ අභිමතාර්ථ:**

   - කැබිනට් අමාත්‍යවරුන්ට හානිපූරණය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම හා නිර්දේශ කිරීම සහ අගතියට පත් පුද්ගලයින්ට ඒකපුද්ගල හා සාමූහික වශයෙන් හානිපූරණ ලබා දීම
   - කැබිනට් අමාත්‍යවරුන් විසින් අනුමත කරන ලද හානිපූරණය සම්බන්ධ ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීම හා ඒ සඳහා පහසුකම් සැලසීම
     මෙහිදී මහජන අධ්‍යාපනය, අනුස්මරණය කිරීම සහ ළමුන්, තරුණයින්, කාන්තාවන්,සහ ලිංගික හිංසනයට ගොදුරුවූවන් සහ ආබාධිත පුද්ගලයින් වෙනුවෙන් මෙම පනත ක්‍රියාත්මක වේ.
   - සංහඳියාව වෙනුවෙන් ක්‍රියාත්මකවන අනෙකුත් යාන්ත්‍රණයන් සමඟ හානිපූරණය සඳහාවන කාර්යාලය අතර සම්බන්ධතාවයන් ගොඩනඟා ගැනීම
   - අගතියට පත් පුද්ගලයින්ට හානිපූරණ ක්‍රියාවලිය නිසිලෙස ඉටුවනවාදැයි අධීක්ෂණය කිරීම

## හානිපූරණය සඳහා වූ කාර්යාලය

**සභාපති**

**සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සමන්විතය**

## හානිපූරණය සඳහා වූ කාර්යාලයේ කාර්යභාරයන්

- අතුරුදන්වූවන්ගේ කාර්යාලය විසින් නම් කරන අගතියට පත් පුද්ගලයින්ට හානිපූරණය ලබා ගැනීම සම්බන්ධව නිර්දේශ ලබා ගැනීම
- අගතියට පත් පුද්ගලයින්ගෙන් හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයින්ගෙන් හානිපූරණය සඳහා ඉල්ලුම්පත්‍ර ලබා ගැනීම සහ ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රවල සත්‍ය අසත්‍යතාව සොයාබැලීම
- හානිපූරණය සඳහා සුදුසුකම් ලබන පුද්ගලයින් සහ ඔවුන්ගේ අවශ්‍යතාවයේ ප්‍රමාණය හඳුනාගැනීම

- රජය විසින් පවත්වාගෙන යන හානිපූරණ වැඩසටහන්වලට අදාළ තොරතුරු හඳුනාගැනීම සහ සංසන්දනය කිරීම (එක හා සමාන හානිපූර්ණ වැඩසටහන් සඳහා යන වියදම් ආදිය)
- හානිපූරණය සඳහා වූ කාර්යාලයේ කාර්යයන් නිසිලෙස පවත්වාගෙන යාම සඳහා නිර්දේශ හා ඉල්ලීම් ලබා ගන්නා ආකාරය, එම ඉල්ලීම් සහ නිර්දේශ පිළිබඳ සොයාබැලීම සහ තහවුරු කිරීම, පරිපාලනය ආදිය සඳහා නීති සැකසීම
- මෙම කාර්යාලයේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී කාර්යය මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති ඇතුලත් නීති සහ මඟ පෙන්වීම් කලින් කලට යාවත්කාලීන කිරීම
- ඒක පුද්ගල සහ සාමූහික වශයෙන් හානිපූරණය ලබා දීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සහ මඟ පෙන්වීම් කැබිනට් මණ්ඩලය සඳහා සකස් කිරීම සහ නිර්දේශ කිරීම
    - හානිපූරණය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබීමට අදාළ නිර්නායක සකස් කිරීම
    - සුදුසුකම් ලබන අගතියට පත් පුද්ගලයින් වෙනුවෙන් හානිපූරණය විය යුතු ප්‍රමාණය තීරණය කිරීම
    - මූල්‍ය හානිපූරණය සඳහා සුදුසුකම් ලැබීමට නිර්නායක සකස් කිරීම
    - හදිසි හානිපූරණ තත්ත්වයක් සඳහා සුදුසුකම් ලබන නිර්නායක සකස් කිරීම
    - අගතියට පත් පුද්ගලයින් හානිපූර්ණය කිරීමේ විවිධ ආකාර සඳහා දායක විය හැකි පාර්ශ්වයන් ලැයිස්තුගත කිරීම
    - අනෙකුත් රාජ්‍ය ආයතන විසින් සැපයිය හැකි හානිපූර්ණ සඳහා නිර්දේශ ලබා දීම
    - හානිපූරණය සඳහා අනුමත අයදුම්පත්‍ර තුළින් මූලකත්වය ලබාදිය යුතු අයදුම් පත්‍ර ලබාදීම සඳහා සකස් කිරීම

- කැබිනට් අමාත්‍යවරුන් විසින් අනුමත කරන ලද හානිපූරණය සඳහා වන ප්‍රතිපත්ති සහ මඟපෙන්වීම් ක්‍රියාවට නැංවීම සහ එම අනුමත ප්‍රතිපත්ති සහ මඟපෙන්වීම් ඔස්සේ අපේක්ෂා කරන ඒක පුද්ගල සහ සාමූහික හානිපූරණය ලබාදීම
- හානිපූරණය සඳහා වූ කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ස්ත්‍රී පුරුෂ ප්‍රතිචාර දැක්වීම ඇතුළුව පුහුණුවීම් සැපයීම
- හානිපූරණය සඳහා වූ කාර්යාලය ඉදිරියේ පෙනී සිටින අගතියට පත් පුද්ගලයින් සඳහා අවශ්‍යවන පරිපාලනමය සහය, ගමන් ගාස්තු, මානසික සහනය ඇතුළුව සහය සැපයීම

## සාමාජිකයින් පත්කිරීම

- ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා පත්කරයි (සභාපති තනතුර සඳහා එහි සාමාජිකයින්ගෙන් නම් 3ක් ව්‍යවස්ථාපිත සභාව විසින් නිර්දේශ කරයි)
- ව්‍යවස්ථාපිත සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් සාමාජිකයින් පත්කරයි

**හානිපූරණය සඳහා වූ කාර්යාලය සඳහා සාමාජිකයින් පත්කර ගැනීමට නිර්දේශ ඉදිරිපත් කිරීමේදී ව්‍යවස්ථාපිත සභාව අවධානය යොමුකරන කරුණු කීපයකි**

- හානිපූරණය සඳහාවූ කාර්යාලයේ සංයුතිය අනුව ස්ත්‍රී පුරුෂභාවය ඇතුළු ශ්‍රී ලාංකික සමාජයේ බහුවිධභාවය නිරූපණය විය යුතුයි.
- මෙම කාර්යාලයේ කාර්යයන් නිසි ලෙස කරගෙන යාමට අදාළ අත්දැකීම් සහ සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

## හානිපූරණය සඳහා වූ කාර්යාලයට සාමාජිකයන් සහ සභාපතිවරයා පත්කර ගැනීමේ ක්‍රියාවලිය

- ව්‍යවස්ථාපිත සභාවේ නිර්දේශ ලැබී දින 14ක් තුළ ජනාධිපතිවරයා විසින් හානිපූරණය සඳහා වූ කාර්යාලය සඳහා සාමාජිකයින් සහ සභාපතිවරයා තෝරා පත්කර ගනු ලැබේ
- දින 14ක් තුළ අවශ්‍ය පත් කිරීම් සිදු කිරීමට ජනාධිපතිවරයා අපොහොසත්වුවහොත් හානිපූරණය සඳහා වූ කාර්යාලය සඳහා ව්‍යවස්ථාපිත සභාව විසින් නිර්දේශිත සාමාජිකයින් පත්වෙනු ලැබේ
- දින 14ක් තුළ පත් කිරීම් සිදු කිරීමට ජනාධිපතිවරයා අපොහොසත්වුවහොත් හානිපූරණය සඳහා වූ කාර්යාලයට ව්‍යවස්ථාපිත සභාව විසින් නිර්දේශ කරන සභාපතිවරුන්ගෙන් ඉහළින්ම නම් සඳහන් අය සභාපතිවරයා ලෙස තෝරා පත්කර ගනු ලැබේ

## හානිපූරණය සඳහා වූ කාර්යාලයේ අරමුදල් පවත්වාගෙන යාම

- හානිපූරණය සඳහා වූ කාර්යාලය එයටම අයත් අරමුදලක් පවත්වාගෙන යයි
  - මෙම පනත ආරම්භ වන දිනට තිබෙන ශේෂය මිනිසුන්ගේ පුනරුත්ථාපනය සඳහා යොදවනු ඇත
  - මෙයට අවශ්‍ය අරමුදල් කලින් කලට පාර්ලිමේන්තුවේදී යෝජනා කර ලබා ගනු ඇත
  - ඊට අමතරව දේශීය සහ විදේශීය ත්‍යාග,පරිත්‍යාග වශයෙන් වූ අරමුදල් ලැබෙනු ඇත